## 417 ඔබෙ සෝබන අත් විහිදා

ඔබෙ සෝබන අත් විහිදා
අප තුළ ඔබෙ ගුණ පහදා
ඔබෙ අදරින් අප සැමදා
පුරවා ලනු මැන මරියේ

ලක්දිව ලස්සන මුතු මැණිකේ
කුංකුම චන්දන රන් දුනුකේ
සැම සොඳ සුවඳින් ඔබ සරසා අපි
කරමුව සිරි ලංකා තිලකේ

ඔබෙ සුදු ගෙලැ ගී මාල දමා
මිණි මුතු මාල දමා
රන් මුතු මාල දමා
අප මුතු මුතු මැණිකේ
අප මුතු සිතු මැණිකේ

බැහැපත් සුකොමල ලීලා
සත් ගුණ රන් දම්මාලා
මුතු ලැල් මෙන් පළඳාලා
විසුමට වර දෙනු මරියේ

දම් ගතියෙන් අප දැඩිවී
බැති ගතියෙන් සිත එඩිවී
දෙව් පෙම් දින දින වැඩිවී
විසුමට වර දෙනු මරියේ

ඔබෙ හා මගෙ පණ එක්වී
ඔබෙ පෙම්බර දරුවෙක් වී
ඔබෙ විජයට මා ලක්වී
විසුමට වර දෙනු මරියේ